# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/32 - 2018 අගෝස්තු මස 01 වැනි බදාදා - 2018.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, 1995 නොවැම්බර් මස 07 වන දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව 2018 ජනවාරි මස 29 වන දින අංක 2056/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත, සහ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවමින් ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "තාක්ෂණ පීඨය" යන අයිතමයට සහ එහි II වන තීරයේ දැක්වෙන අනුරූපී සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම සහ සටහන් එකතු කිරීමෙන් එකී උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| | |
|---|---|
| "වෛද්‍ය පීඨය | 1. කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය |
| | 2. ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය |
| | 3. භෞතවේද අධ්‍යයනාංශය |
| | 4. පරපෝෂවේද අධ්‍යයනාංශය |
| | 5. ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය |
| | 6. අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| | 7. ව්‍යාධිවේද අධ්‍යයනාංශය |
| | 8. ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| | 9. පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| | 10. භිෂග්වේදය අධ්‍යයනාංශය |
| | 11. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| | 12. වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| | 13. ළමා රෝග හා කෞමාරභෘතීය අධ්‍යයනාංශය |
| | 14. ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය |
| | 15. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය.". |

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

08 - 538


1A - PG 4151 — 508 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*